# රුහුණ විශ්වවිද්‍යාලය

## 2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 3000 ස්ථලය
## දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

## SLS 32553/32653 - විශ්ව සාහිත්‍ය පරිචය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

01. පුරාතන සිංහල සාහිත්‍යය හුදු ඒක භාෂීය සාහිත්‍යයික ප්‍රජාවකගේ නිර්මිතයක් ද එසේත් නැතහොත් කලාපීය භාෂා සංස්කෘතික සම්භාෂණයක ප්‍රතිඵලයක් ද යන වග නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

02. "ජපන් සාහිත්‍යය වූකලි සංකීර්ණ සමාජ - මානව සබඳතා නිරූපණය කෙරෙන සුවිශේෂ අනන්‍යතාවක් සහිත සෞන්දර්ය ප්‍රකාශනයකි." ඔබට අභිමත ජපන් සාහිත්‍ය නිර්මාණ ඇසුරෙන් මේ කියමන පිරික්සන්න.

03. එක්කෝ,

"බැද්දේගම ශ්‍රී ලංකාව පාදක කරගත් ප්‍රථම යථාර්ථවාදී නවකථාව යි." පක්ෂ ව හෝ විපක්ෂ ව අදහස් දක්වන්න.

නැතහොත්,

සමාජ - මානව සබඳතා අතිශය සියුම් ලෙස නිරූපිත නවකථාවක් ලෙස බැද්දේගම හැඳින්විය හැකි දැයි විමසන්න.

04. "අප්‍රිකානු නවකථාකරුවා තමාට සමීප සමාජ දේශපාලන යථාර්ථය ස්වකීය නවකථාවට විෂය කර ගත්ත ද එම සාහිත්‍ය නිර්මාණවල නිරූපිත යථාර්ථය තුන්වන ලෝකයේ පොදු දශාව විදහා දක්වයි." මේ ප්‍රකාශය පොදුජනයාගේ මිනිසෙක් කෘතිය ඇසුරෙන් පිරික්සන්න.

05. සංස්කාර් උසස් නවකථාවක් ලෙස ඔබ අගය කරන්නෙහි ද? එසේ නම් ඊට හේතු කවරේ දැයි දක්වන්න.

06. මානව සබඳතාවල විවිධ හා සංකීර්ණ ලක්ෂණ නිරූපණයට විශ්ව සාහිත්‍යයේ කෙටිකතාකරුවන් ප්‍රවේශ වී ඇති අයුරු නිර්දිෂ්ට කෙටිකතා ඇසුරෙන් තුලනාත්මක ව සාකච්ඡා කරන්න.

07. එමා බෝවාරි යනු හුදු ශෝකාන්ත ප්‍රේම වෘතාන්තයක් පමණක් නො ව ගේහසිත ජීවිතයේ සංකීර්ණත්වය ද නිරූපිත නවකථාවකි. විමසන්න.

08. විශ්ව සාහිත්‍ය කෘතියක අන්තර්ගත විය යුතු ලක්ෂණ හිමබිම කෘතිය ඇසුරෙන් පරීක්ෂා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 12 බැගිනි)

************************

214